ස.සෙ.කො.චක්‍රලේඛ අංක 01 /2019

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2019.03. 08

වයඹ පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමුපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමානාායාධිකාරී වරුන් වෙත,

## සමුපකාර සේවකයින් සඳහා 2019 වර්ෂයේ නිවාඩු

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

1. ජනවාරි - 15 දෙමළ තෛපොන්ගල් දිනය(මීලා-දුන් නබි) නබි නායක තුමාගේ ජන්ම දිනය
2. ජනවාරි - 20 දුරුතු පුර පසළොස්වක පෝය දිනය.
3. පෙබරවාරි - 04 ජාතික දිනය.
4. පෙබරවාරි - 19 නවම් පුර පසළොස්වක පෝය දිනය.
5. මාර්තු - 20 මැදින් පුර පසොළොස්වක පෝය දිනය.
6. අප්‍රේල් - 13 සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනයට පෙර දිනය.
7. අප්‍රේල් - 14 සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය.
8. අප්‍රේල් - 19 බක් පුර පසොළොස්වක පෝය දිනය.
9. මැයි - 01 මැයි දිනය.
10. මැයි - 18 වෙසක් පුර පසොළොස්වක පෝය දිනය.
11. මැයි - 19 වෙසක් පුර පසොළොස්වක පෝය දිනට පසු දිනය.
12. ජූනි - 16 පොසොන් පුර පසොළොස්වක පෝය දිනය.
13. ජූලි - 16 ඇසල පුර පසොළොස්වක පෝය දිනය.
14. අගෝස්තු - 14 නිකිණි පුර පසොළොස්වක පෝය දිනය.
15. සැප්තැම්බර් - 13 බිනර පුර පසොළොස්වක පෝය දිනය.
16. ඔක්තෝබර් - 13 වප් පුර පසොළොස්වක පෝය දිනය.
17. නොවැම්බර් - 10 නබිනායක තුමාගේ උපන් දිනය.
18. නොවැම්බර් - 12 ඉල් පුර පසොළොස්වක පෝය දිනය.
19. දෙසැම්බර් - 11 උඳුවප් පුර පසොළොස්වක පෝය දිනය.
20. දෙසැම්බර් - 25 නත්තල් උත්සව දිනය.

ඉහත සඳහන් දිනයන්ට අමතරව සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් සමුපකාරයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. තවද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි “රජයේ නිවාඩු” දිනයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින්ට නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළ හොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිති වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳව තීරණය කළ හැක.

02. උක්ත දිනයන් නිවාඩු දින වශයෙන් යොදාගෙන ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාල හෝ ප්‍රාදේශිකයන් මේ දින වල විවෘතව තැබීමටත්, එම දින වල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරනු ලැබූ විට දී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදා ගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, ව්‍යාපාරික ස්ථානයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත්, නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

03. ඉහත දැක් වූ නිවාඩු දින වලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 ½ තුළට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩදිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්ප වශයෙන් දෙපක්ෂයේ එකඟතාවය ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකි වේ.

04.මෙම චක්‍ර ලේඛය නිකුත් නරනු ලබන්නේ වයඹ පලාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

O/C 2019.03.08

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත.
2. ලේකම්, සමූපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර්(වයඹ පළාත) - කා. දැ.පි.
4. සියළුම සමූපකාර සේවක කොමිසන් සභා ලේකම්වරු - දැ.ගැ.පි - අ.ක.ස.
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.